Librarians are almost always very helpful and often almost absurdly knowledgeable. Their skills are probably very underestimated and largely underemployed.

**Charles MEDAWAR**

***The Social Audit Consumer Handbook*,**

**Macmillan, 1978, p. 41**

# ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ප්‍රධාන මහායාන බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන වූ අභයගිරිය සහ නාලන්දා විශ්වවිද්‍යාලය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

______________ආචාර්ය අයි. එච්. ආර්. එස්. රණසිංහ


සාරාංශය

අභයගිරිය සහ නාලන්දා විශ්වවිද්‍යාලය ශ්‍රේෂ්ඨ මහායාන බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන වශයෙන් ජාත්‍යන්තර කීර්තියට පත් ව තිබුණි. ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසේ මහාවිහාරයෙන් බිඳී ගිය කණ්ඩායමකින් ඇරඹුණ අභයගිරියෙහි ක්‍රිස්තු වර්ෂ පස්වන සියවස වන විට නේවාසිකයන් පන්දහසක් ද, ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසේ සාමාන්‍ය බෞද්ධ ආරාමයක් සේ ඇරඹුණ නාලන්දා විශ්විද්‍යාලයෙහි ක්‍රිස්තු වර්ෂ හත්වන සියවස වනවිට නේවාසිකයන් දස දහසක් ද සිටි අතර, සමකාලීනව සියලු ම බෞද්ධ අධ්‍යාපන ආයතන අභිභවා පැවති මෙම මධ්‍යස්ථාන වෙත වෙනත් රටවල සිසුහු ද බුදුදහම ඉගෙනීමට මෙන් ම බෞද්ධ ග්‍රන්ථ එකතු කිරීමට ද පැමිණියහ. මෙම ආයතනයන්හි වර්ධනයට හා කීර්තියට ඉතා පුළුල් විෂයමාලාවන්, විද්වත් ආචාර්ය මණ්ඩල මෙන් ම රාජ්‍ය අනුග්‍රහය ද හේතු විය.

දකුණු ඉන්දිය ආභාසය මත නිකායක් වශයෙන් දියුණු වීමට පටන් ගත් අභයගිරිය සහ දකුණු ඉන්දියාව අතර කිට්ටු සම්බන්ධතාවයක් තිබුණි. මහායානය ප්‍රචලිත කිරීමට උරදුන් ඉන්දිය දාර්ශනිකයන්ගේ මතිමතාන්තර ඇතුළත් ග්‍රන්ථ මෙරට ට ලැබුණ අතර, ක්‍රමයෙන් අභයගිරිය මහායානය ඉගැන්වීමේ මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය විය. අභයගිරිවාසීන් එවකට අන්තර්ජාතික වශයෙන් කීර්තියක් තිබූ ඉන්දියාවේ නාලන්දා, වික්‍රමශීලා, ජගත්දලා, ඖදන්තපූරී ආදී බෞද්ධ විශ්වවිද්‍යාල සහ පල්ලවාරාමය, නාගර්ජුනකොණ්ඩ ආදී බෞද්ධ මධ්‍යස්ථාන සමග සම්බන්ධතාවයන් පවත්වා ඇත. ක්‍රිස්තු වර්ෂ පස්වන සියවස පමණ වන විට මහායාන බෞද්ධ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයක් වශයෙන් ජාත්‍යන්තර කීර්තියට පත් අභයගිරියේ භික්ෂූන් ඉන්දියාව සමග

පමණක් නො ව, චීනය, ජාවා, කාශ්මීරය ආදී රටවල් සමග පවත්වන ලද ආගමික සහ අධ්‍යාපනික සම්බන්ධතා හේතුවෙන් ජාත්‍යන්තර මට්ටමේ ආගමික සහ අධ්‍යාපනික මධ්‍යස්ථානයක් බවට පත් ව තිබූ බව සැලකිය හැකි ය.

ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසේ සාමාන්‍ය බෞද්ධ ආරාමයක් සේ ඇරඹුණ 'නාලා' නමින් හැඳින් වූ නාලන්දාව සියවස් තුනක් ගතවීමටත් පෙර ඉතා කීර්තිමත් මහායාන විශ්වවිද්‍යාලයක් බවට පත්විය. මෙලෙස ප්‍රචලිත වූ මෙම ආයතනයට ඉන්දියාවේ වූ වෙනත් මහායානික, ථෙරවාදී අධ්‍යාපන ආයතන පමණක් නො ව හින්දු, ජෛන ආදී ආගම්වලට සම්බන්ධ අධ්‍යාපන ආයතන ද අභිභවා නැගී සිටීමට හැකි විය. මහායාන බුදුදහමේ කේන්ද්‍රස්ථානයක් ලෙස විශ්ව කීර්තියට පත් මෙහි දේශීය සිසුන් පමණක් නො ව විදේශීය සිසුන් ද ඉගෙනීම ලබා ඇත. එහි ඉගෙනුම ලැබූ ශිෂ්‍යයින් අතර ලංකාවෙන්, චීනයෙන්, තිබ්බතයෙන් පැමිණි අය පමණක් නො ව පපන්, ජාවා, සුමාත්‍රා ආදී රටවලින් පැමිණි අය ද වූහ.

මෙම අධ්‍යයනයේ අරමුණ මෙම අධ්‍යාපන ආයතන පිළිබඳ තුලනාත්මක ගවේෂණයක් කිරීමයි. මෙහි දී පාදක කරගනු ලබන ඓතිහාසික මූලාශ්‍ර, ආයතනයන්ගේ ආරම්භය සහ වර්ධනය, ශිෂ්‍ය ප්‍රවේශය, විෂය මාලාවන් සහ අධ්‍යාපන ක්‍රමවේදය, ආචාර්ය මණ්ඩලය, නේවාසික සිසුන්, දිනචරියාව සහ ආයතනික පාලනය, සිසුන් එවූ රටවලට රැගෙන ගිය ග්‍රන්ථ, පොත්ගුල් සහ පරිහාණිය පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.

1. මූලාශ්‍ර

මෙම අධ්‍යයනය ඓතිහාසික ගවේෂණයක් හෙයින් පාදක කරගනු ලබන්නේ ඓතිහාසික මූලාශ්‍රයන් ය. අභයගිරිය පිළිබඳ ව අපට මූලික වශයෙන් තොරතුරු ලැබෙනුයේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයයන් මඟිනි. එයට අනුග්‍රහය දක් වූ රජුන් සහ ප්‍රභූන් පිහිට වූ අභිලේඛන මෙහි දී වැදගත් වේ. අභයගිරියට අයත් අධ්‍යාපන ආයතනයන්හි අභ්‍යන්තර සහ බාහිර පාලනය පිළිබඳ තොරතුරු අන්තර්ගත හෙයින්, සමහර අභිලේඛන විහාර කතිකාවත් නමින් ද හැඳින්වේ. එම කතිකාවත් ආයතනයන්හි අභ්‍යන්තර සහ බාහිර පාලනය ක්‍රමවත් වීමට පමණක් නොව, අධ්‍යාපනය නංවාලීමට ද



හේතු විය. ඒවා අතුරින් V කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපිය[1] සහ IV මහින්ද රජුගේ මිහින්තලේ පුවරු ලිපි[2] වැදගත් වේ.

අභයගිරිය පිළිබඳව ලියැවුණු ප්‍රධාන ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍රය ලෙස සැලකිය හැකි උත්තරවිහාරට්ඨ කථා මහාවංසය නමැති ග්‍රන්ථය, අනුරාධපුර යුගයේ පැවති අභ්‍යන්තර අරගල හෝ විදේශ ආක්‍රමණ හේතුවෙන් විනාශයට පත්වීම, අභයගිරිය පිළිබඳ තොරතුරු දැන ගැනීමට තිබූ වැදගත් මූලාශ්‍රයයක් ගිලිහී යාමකි. මහාවිහාරවාසීන්ගේ වංසකථාව ලෙස සලකන මහාවංසයේ පළමු කොටසට ටීකාවක් වශයෙන් ක්‍රිස්තු වර්ෂ හත්වන සියවසෙහි ලියන්නට ඇතැයි සලකන වංසත්ථප්පකාසිනියේ උත්තරවිහාරට්ඨ කථා මහාවංසය එයට මූලාශ්‍රය වූ කෘතියක්[3] ලෙස සඳහන් කර ඇත.

විදේශ සංචාරකයින්ගේ වාර්තා ද මෙම අධ්‍යයනයේ දී වැදගත් වේ. ඈත අතීතයේ සිට ම වෙළඳාම නිසා ලංකාව සහ චීනය අතර තිබූ සම්බන්ධතාවය, බුදුදහම පැතිරී යාමත් සමඟ වැඩි දියුණු වූ හෙයින්, ගිහි පැවිදි සංචාරකයින් එකිනෙක රටවලට ගොස් ඇත. ඒ අනුව ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසේ මුල් භාගයේ මහානාම (ක්‍රි. ව. 410-432) රජ සමයේ මෙරටට පැමිණ දෙවසරක් අභයගිරියේ නේවාසිකව ඉගෙන ගත් චීන ජාතික ෆාහියන් හිමියන් විසින් ලියන ලද තත්කාලීන ශාසනික තොරතුරු වාර්තා අභයගිරිය පිළිබඳ හැදෑරීමේ දී මහත් සේ උපකාරී වේ. එසේ ම චීන ජාතික හියුංසියැං හිමිගේ වාර්තාව ද අපට ප්‍රයෝජනවත් වේ. සිය සංචාරයේ දී ලංකාවට ඒමට සූදානම්ව සිටිය ද, එවකට එනම් ක්‍රිස්තු වර්ෂ හත්වන සියවසේ මධ්‍ය භාගයෙහි මෙරට පැවති අර්බුද සහ දුර්භික්ෂ හිය නිසා එම සංචාරය වැළකී ඇත. එබැවින් මෙරටින් ඉන්දියාවට ගිය බෝධිමේඝේශ්වර සහ අභයදංෂ්ට්‍ර ප්‍රමුඛ භික්ෂූන්ගෙන් ඇසූ තොරතුරු සිය වාර්තාවේ සඳහන් කර ඇත.

---

1. Encyclopedia Zeylanica Vol. I. pp. 43-46
2. EZ. Vol. I, pp 84-90
3. වංසත්ථප්පකාසිනී (1994) අනු. අකුරටියේ අමරවංශ හිමි සහ හේමචන්ද්‍ර දිසානායක. මූලාශ්‍රයයෝ. පාලි සහ බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය xx පිටුව.